"හැඳිමිටේ නුවණ"

සිංහලෙන් කතා කරන අමෙරිකානු මහාචාර්යවරියක්........

ලොව මියයන භාෂාවන් අතරින් එක් භාෂාවක් ලෙස සිංහල භාෂාව හඳුවන්නට අපේ ම අය පසුගිය කාලයක උනන්දු වුණා. එහෙත් පරිගණක තාක්‍ෂණයත් ඒ හා බැඳුණ තොරතුරු තාක්ෂණයත් අනුව නව පිබිදීමක් ලොව පුරා විප්‍රවාසීව සිටින හා මව්බිමේ සිටින ඇතැම් පිරිස් අතර දක්නට ලැබෙනවා. සිංහල වචන ශබ්දවන ආකාරය අනුව ඉංග්‍රීසි අකුරින් යතුරු ලියනය කිරීමට අපගේ අය අතර උනන්දුවක් ඇතිවූයේ විදුලි තැපෑල සහ ජංගම දුරකතන පණිවිඩ නිසා යයි කියන්න පුළුවන්. "සිංග්ලිෂ් " (Singlish) නමින් පසුකාලීනව නම් කෙරුන මේ මුසුව " සිංගිරිසි" යනුවෙන් ගීත නිර්මාණයකට පවා ඇතුලත් වූයේ වසර 2000 දී පමණ.

අපගේ මව්බස වහරණ, ඒ හැකියාව පවත්වාගෙන යන දෙමළ හිතවතුන් අපහට විදේශයන්හිදී මුණ ගැහෙනවා. සිංහලය වහරණ සුදු ජාතිකයින් පවා හමුවන අවස්ථා නැතිවො නොවේ. එහෙත් අපගේ භාෂාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් තරමක් දුරට හෝ උගෙන, මව් බිමේ සාමාජයික තොරතුරු ඇසුරින් පර්යේෂණ කරනා මහාචාර්යවරියක අපට හමුවුණේ මුල්වතාවට.

ඇමරිකාවේ ඔරිගන් (Oregon) ප්‍රාන්තයේ " පෝට්ලන්ඩ් ස්ටේට්" (Portland State) විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරියක වන අචාර්ය මිචෙල් රූත් ගැම්බර්ඩ් මහත්මිය (Professor Michele Ruth Gamburd) අපට හමුවන්නේ රාජ්‍ය සම්මාන ලාභී ප්‍රවීන ගත් කතුවරියක වන ස්වර්ණකාන්ති රාජපක්‍ෂ මහත්මියගේ මෙල්බන් නිවහනේදීයි. මහාචාර්යවරිය සිංහල කතාවට හැකියාවක් දක්වන්නා සේම සරල දේ කියැවීමටත්, කෙටියෙන් ලිවීමටත් හැකියාව දක්වනවා. මේ වන විට ඉංග්‍රීසි බසින් ග්‍රන්ථ පහක් එළිදක්වා ඇති මහාචාර්යවරියගේ ග්‍රන්ථ තුනක් රාජපක්‍ෂ මහත්මිය සිංහලයට නගා තිබෙනවා.

වසර 1987 දී ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය විෂය හදාරා මුල් උපාධිය ලබා ගන්නා මහාචාර්යවරිය, 1989 දී ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් දර්ශනය හා දේවත්වය පිළිබඳව උපාධියත්, 1991 දී මිචිගන් විශ්ව විද්‍යාලයේන් මානව වංශ විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් 1995 දී එම විශ්ව විද්‍යාලයෙන් ම මානව වංශ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියත් ලබා ගන්නවා. අප ඇය සමඟ පිළිසඳරට එක්වුණේ සිංහලයෙන්.

ඇය මූලිකව හාදාරන විෂය ක්ෂේත්‍රය කුමක්ද කියලා දැන ගැනීමට අප මුලින්ම යොමුවුණා.

"මගේ විෂය වෙන්නේ මානව වංශ විද්‍යාව. මේ විෂය ක්ෂේත්‍රයේ කොටස් හතරක් තියෙනවා. පළමු වැනි කොටස තමයි "ලිංග්විස්ටික් " (Linguistic). දෙවෙනි එක "ආකියෝලොජි" (Archaeology). තුන්වන කොටස පිසිකල් ඇන්ඩ් බයොලොජිකල් ඇන්ත්‍රපොලොජි (Biological & Physical Anthropology) කියනවා. හතරවෙනි කොටස තමයි කල්චරල් ඇන්ත්‍රපොලොජි (Cultural Anthropology)"

ස්වර්ණකාන්ති මහත්මිය විෂයයන් විස්තර කරමින් :

"මානව වංශ විද්‍යාවට ඉංග්‍රිසියෙන් කියන්නේ ඇන්ත්‍රපොලොජි ('nthropology) කියලා. එතකොට ලිංග්විස්ටික් ඇන්ත්‍රපොලොජි (LinguisticAnthropology) කියලා කියන්නේ මානව වංශ විද්‍යාවේ වාග් විද්‍යාත්මක කොටස. එතකොට එහි තියෙන පුරාවිද්‍යාත්මක පැත්ත තමයි ආකියෝලොජි ඇන්ත්‍රපොලොජි කියලා හඳුන්වන්නේ. පිසිකල් ඇන්ත්‍රපොලොජි (PhysicalArchaeology) කියන්නේ මනුෂ්‍යයාගේ පරිණාමය පිළිබඳව කියැවෙන කොටස. එතකොට කල්චරල් ඇන්ත්‍රපොලොජි කියන්නේ සමාජ විද්‍යාත්මක කොටස. ඒ කියන්නේ සංස්කෘතිකමය පැත්ත හැදෑරීමයි."

මිචෙල් මහත්මිය නැවතත් අපට එක්වෙමින් :

"කල්චරල් ඇන්ත්‍රපොලොජි" තමයි මගේ ප්‍රියතම කොටස. ඒ මිනිස්සුන්ගේ ගති පැවතුම් ගැනත් ඉගෙන ගන්න එකයි."

මේ විෂය ධාරාවට මිෂෙල් රූත් ගැම්බර්ඩ් මහාචාර්යවරිය යොමු වූ ආකාරය පිළිබඳවත් අපගේ අවධානය යොමුවුණා.:

සිසිර දිසානායක

"මගේ අම්මාත් ආචාර්ය උපාධියට කළේ මානව විද්‍යාව. මං කුඩා කාලයේදීයි අම්මා ඒ උපාධියට අවශ්‍ය පර්යේෂණ කළේ. ඉතින් මට මානව විද්‍යාව එපා වුණා. ඒ නිසා මම මුලින්ම විශ්ව විද්‍යාලයට ගිහින් තෝරාගන්නේ "ඉංග්ලිෂ් ලිටරේචර්" (English Literature). ඒ අනුව ඇයගේ මුල්ම විෂය වන්නේ ඉංග්‍රිසි සාහිත්‍යයයි.

මගේ දෙවෙනි කලා උපාධිය වුනේ "ෆිලෝසෆි ඇන්ඩ් තියෝලොජි (Philosophy & Theology& කියන උපාධියයි. ඊට පස්සෙයි සමාජ විද්‍යාව පැත්තට නැඹුරුවෙලා ආචාර්ය උපාධිය කළේ. ඉතින් ඒ සඳහා යම්කිසි පර්යේෂණයක් කරන්න වෙනවා කොහේහරි ගිහින්. අම්මාටත් ඒ අත්දැකීම ලැබුණේ ලංකාවෙන් ඉතින් මමත් අම්මාවගේ ලංකාවට ඇවිල්ලා ඉගෙන ගත්තා."

මහාචාර්ය මිෂෙල් රූත් ගැම්බර්ඩ් මහත්මිය සිය පර්යේෂණ කටයුතුවලට තෝරගන්නේ ශ්‍රී ලංකාව. විශේෂ හේතු තිබුණද මේ තෝරාගැනීමට? නැතහොත් සිය මව් අනුව යාමක් පමණක් ද මේ?

"අම්මා සිරිත් විරිත් ගැන ඉගෙන ගන්න ගොඩක් කැමැත්තෙන් හිටියේ. ඇය මුලින් යන්න හිටියෙ ටිබෙට් රටට. ඒත් රටේ ඒ දවස්වල තිබුණ තත්වය නිසා ඒ අදහස අත හරින්න ඇයට සිද්ධ වුණා. ඇයගේ නේවාසිකාගාරයේ හිටිය ලංකාවේ යෙහෙළියක් තමයි ඇයට ලංකාව තෝරගන්න යෝජනා කළේ. ඒ නෝනගේ ගෙදර ඉඳන් තමයි අම්මගේ පර්යේෂණවලට ඕන කරන හොඳ ගමක් හෙව්වේ. ඉතින් අම්මට හම්බවුණ ගම හරිම හොඳයි. පන්සලක් තියෙනවා, කුරුඳු වතු තියෙනවා, ගෙවල් ගොඩක් තියෙනවා, හොඳ මිනිස්සුත් ඉන්නවා." ඇය සිංහල බස උසුරුවමින් කරනා මේ පැහැදිලි කිරීම සැබැවින්ම ඉතාම ප්‍රියජනකයි. මේ ගම පිළිබඳව කතාකිරීමේදීයි ඇයගේ කතාවට ස්වර්ණකාන්තී රාජපක්‍ෂ නම් වන භූමිකාව අවතීර්ණ වෙන්නේ. මිචෙල් මහත්මිය ඇය අමතන්නේ "කාන්ති අක්කා" නමින්.

"මේ ගමේ නම එළි කරන්න බෑ. මොකද මේවාගේ පර්යේෂණ කටයුතුවලදී රකින්න වෙන ආචාර ධර්මවලට පටහැණි වනනිසා. ඒ තොරතුරු හෙළි කිරීම සාදාචාරාත්මක වෙන්නේ නෑ. මේ ගම අම්බලන්ගොඩ නගරයට ආසන්න මුහුදුබඩ ගම්මානයක්. ඇත්තට ම මිචෙල්ගේ මව ඇතුළු ඒ පවුල ගමට හිතවත්වුණා; ලෙන්ගතු වුණා. අවුරුදු දෙකකට පමණ පසුව ආපහු ගියත් වරින් වර ඇවිත් ඒ සම්බන්ධතාවයන් පවත්වා ගෙන ගියා. ඉතින් මිෂෙල් මහත්මියත් තමන්ගේ පර්යේෂණ කටයුතුවලට මේ ගමම තෝරා ගත්තේ ඒ බැඳීම නිසා වෙන්න ඇති." ස්වර්ණකාන්ති රාජපක්‍ෂ මහත්මිය ඒ පසුබිම පැහැදිලි කළා.

මුල් වරට මවත් සමඟ ලංකාවට පැමිණෙන විට මිචෙල් දැරියගේ වයස අවුරුදු දෙකක් පමණයි. මව් ආභාෂයෙන් මේ ගමට බැඳුණ ඇය පසුකලෙක යළිත් පැමිණ කළ කී දේ පිළිබඳව අප විමසිලිමත් වුණා.

"1991 ද ආයෙත් ගමට ආවා. ඒ ආව වෙලාවේ කැළණිය විශ්ව විද්‍යාලයේදී මම සිංහල ටිකක් මුලින් ම ඉගෙන ගත්තා. අම්මා ගමේ හිටිය කාලෙන් පස්සේ ගම වෙනස් වෙලා තියෙන හැටි දිහා බලනකොට උඩට ආව එක මාතෘකාවක්. ගමේ නෝනලා ගොඩක් මැද පෙරදිග යනවා. රට ගිහින් ගමට සල්ලි එවනවා. ඉතින් ඒ ගැන හොයලා බලලා පී.එච්.ඩී. උපාධියට පර්යේෂණය කළා. ඒ පර්යේෂණය එක්ක කරපු පොත තමයි, "ද කිචන් ස්පූන්'න් හැඬල් " (The Kitchen Spoon's Handle-Transnationalism and Sri Lanka's migrant Housemaids) ඒ පොත ස්වර්ණකාන්ති රාජපක්‍ෂ මහත්මිය පරිවර්තනය කළා. "හැඳිමිටේ නුවණ" කියනනමින්.

මේ පරිවර්තනය "හැඳිමිටේ නුවණ" නමින් හැඳින්වීමට ස්වර්ණකාන්ති රාජපක්‍ෂ කතුවරිය සිතුවේ කිමදැයි කෙනෙකුට සිතෙන්න පුළුවන්.

"මේ පොතේ නම වෙන්නේ සංක්‍රමණික ජාතිකත්වය සහ ශ්‍රී ලංකාවේ විගමනික ගෘහ සේවිකා වෘත්තීය " හැඳිමිටේ නුවණ" කියලා මිචෙල් උපමාතෘකාවක් යෙදුවා. අපේ රටේ ජනප්‍රිය වහරක් තියෙනවානේ. " ගැහැණුන්ගේ නුවණ හැඳිමිටේ දිගයි" කියලා. මිචෙල්ට කියන්න ඕන කළේ ඒක එහෙම නෙවෙයි; ඔවුන් දුර දිග බලලා කටයුතු කරන පිරිසක්ය කියන එක."

මිචෙල් රූත් ගැම්බර්ඩ් මහාචාර්යවරියගේ දෙවන පර්යේෂණයට අදාල කරුණු ගොනු වූ අන්දම සැබැවින් ම දෛවෝපගතයි.

"මම මත්ද්‍රව්‍ය පිළිබඳව පර්යේෂනය කරන්න පටන් ගත්තා. සුනාමි එක ආවා නේද 2004 දී. ඉතින් ඒ සුනාමි එක ඇරෙන්න වෙන මාතෘකාවක් තිබුණෙ නෑ. ඒ නිසා මගේ ඊළඟ මාතෘකාව වුණොත් සුනාමිය ම යි. ඒ පර්යේෂනය අනුව කරපු පොත තමයි "ද ගෝල්ඩන් වේව්" (The Golden Wave - Culture and Politics after Sri Lanka's Tsunami Disaster) ඒ පොතත් ස්වර්ණකාන්ති රාජපක්‍ෂ මහත්මිය සිංහලයට පෙරළුවා." 2004 දෙසැම්බර් 26 දින නැගුණ උදම් රළ ඇසුරින් ලියවුණ මේ ග්‍රන්ථය ස්වර්ණකාන්ති රාජපක්‍ෂ කතුවරිය මේ පරිවර්තනය කරවමින් නම් කරනවා " ස්වර්ණ තරංගය කියලා......

"මිෂෙල්ට ඕන කරපු නම තමයි "රත්තරන් රැල්ල" කියන නම. මිනිස්සුන්ට දුක් පීඩා ගෙනාව ගිනි රැල්ලක් වුණාට පසුකාලීනව බේරුණ අයට වාසි සහගත තත්වයක් ලැබුණා. මොකද අනන්ත අප්‍රමාණ විදේශාධාර ප්‍රමාණයක් ලැබුණ නිසා. බේදවාචකයක් කියන දැක්ම වෙනස් වුණා මිනිස්සුන්ගේ. මම ඒක හරිද වැරදිද කියන්න උත්සාහ කරන්නේ නෑ. නමුත් ද්‍රව්‍ය හා මූල්‍යමය ආධාර ලබා ගත්තා අපේ අය අවශ්‍ය විදියට වගේ ම අනවශ්‍ය විදියටත්. මේ ආව රත්තරන් රැල්ලක් බවට පත්වුණා මේ විපතින් බේරුණ බොහෝ අයට. ඒ දිහා උපහාසයෙන් බැලීමකුත් වෙනවා මේ මාතෘකාව. පොත අළෙවියේ දී සැහැල්ලුවට ලක් වෙයි කියලා හිතපු නිසයි "ස්වර්ණ තරංග" නම මම යෝජනා කළේ. යම්කිසි කාව්‍යමය බවකුත් එක්වුණා ඒ නමට."

මහාචාර්ය මිචෙල් රූත් ගැම්බර්ඩ් මහත්මියගේ තෙවන පර්යේෂණයත්, ඒ සම්බන්ධව එළි දැක්වුණ නිබන්ධයත්, එහි පරිවර්තනයත් පිළිබඳව ලබනවර "සන්නසෙන් " කියවමු.

මේ සාකච්ඡාවේ හඬ පටයට සවන් දෙන්නට
www.shanidaa.com අඩවියට ගොඩවන්න

පොත් පත් පුවත්

පරිසරය නිවැරදිව දකිමු

දයාරත්න වීරසේකර

ඇස් ගොඩගේ ප්‍රකාශනයකි

පරිසරය නිවැරදිව දකිමු
දයාරත්න වීර

දිනෙන් දින විවිධාකාර ස්වබාවික විනාශ පිලිබඳව අසන්නට අපට සිවු තිබේ. මේ ස්වභාවික විනාශ පිටුපස ඇත්තේ මිනිසා විසින් පරිසරයට කරනු ලබන විවිදාකාර අත පෙවීම් නිසා ඇතිවූ විෂමතා යයි මතයක් සමාජය පුරා පැතිරී ඇත. ඒ නිසාම පරිසරය පිලිබඳව වැඩි අවධානයක් මේ කාලයේ යොමුවී තිබේ යයි කීවොත් එය නිවැරදි ය.

පරිසරය පිලිබඳව ලියැවුණ පොත් පත් ඉංග්‍රීසියෙන් තියවන්නට අපට හැකියාව තිබුණද ඒ විෂය වෙනුවෙන් සිංහල භාෂාවෙන් පොත් පත් ලියැවෙන්නේ නැති තරම් ය. එය විශාල අඩුවකි.

සන්නසට "ආ මග සටහන්" ලිපි පෙළ ලියන දයාරත්න වීරසේකර මහතාගේ "පරිසරය නිවැරදිව දකිමු" පොත මුද්‍රණයෙන් නිකුත් වී තිබෙන්නේ පරිසරයට ඇල්මක් දක්වන පාඨකයන්ගේ මන දොල පුරවමිනි.

පොතට පසුවදනක් ලියන විශ්‍රාමික විභාග කොමසාරිස් ස්ටර්ලින් පෙරේරා මහතා ලියා ඇති සටහන දයාරත්න වීරසේකර මහතාට මෙවන් ග්‍රන්ථයක් සම්පාදනය කරන්න ඇති ශක්තියට ශාක්ෂි සපයයි. "අධ්‍යාපන අමාත්‍යංශ මගින් 1970 දශකයේදී ද්විතීය පාසල් සඳහා සංවිදානය කරන ලද ක්ෂෙත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන වැඩ සටහනට දයාරත්න වීරසේකර මහතා විද්‍යා අධ්‍යාපන නිලධාරිවරයකු ලෙස සම්බන්ධ විය.

"ස්ථානගත පරිසර අධ්‍යයනය" යන නමින් හඳුන්වන ලද මෙම වැඩ සටහන ඉතා ඉක්මනින් පාසල් අතර ව්‍යාප්ත් විය. කතුවරයා පාසල් සිසුන් ගුරුවරුන් සහ නිලධාරීන් සමග පරිසර අධ්‍යයන කටයුතු වලට සම්බන්ධ වී පරිසර අධ්‍යාපනය පිලිබඳව පුලුල් දැනුමක් ලබා ඇත. රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුවද ඔහු අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙහෙයවන ලද පරිසර අධ්‍යාපන වැඩ සටහන් ආශියකම උපදේශකවරයකු ලෙසද සේවය කර තිබේ.

ඔහුගේ අත්දැකීම් පරිසර විද්‍යාත්මක පොතක් ලෙස සරල බසින් සිංහල පාඨකයන් සඳහා ඉදිරිපත්වීම පිලිබඳව මගේ ප්‍රසාදය පළකරමි"

වීරසේකර මහතා සිය ග්‍රන්ධයේ අන්තර්ගතය කොටස් එකොළහකට බෙදා ඉදිරිපත් කරන්නේ පාඨකයා වෙහෙස නොකරමිනි.

- අපේ වටපිටාව
- වටපිටාවේ සියල්ල පරිසරයයි
- පරිසරයේ අන්තර් සබඳතා
- අපේ ආහාර පරිසරයෙනි
- ශක්තිය ලැබෙනුයේ ආහාර වලිනි
- අපගේ අපද්‍රව්‍ය මොනවාද
- පරිසරයේ ජෛව විවිධත්වය
- ජලය මහඟු සම්පතකි
- පරිසර දූෂණය සිදුවන්නේ කෙසේද?
- පරිසරය සුරකිමු
- අපේ පරිසර කටයුතු දෙස හැරී බලමු

විවිධ ක්ෂේත්‍රයන්හි යටතේ සිය දැනුම වර්ධනය කරගන්නට බලා සිටින පාඨකයනට සිංහල බාෂාවෙන් ලියැවුණ පොත පත හිඟ මෙවන් යුගයක දයාරත්න වීරසේකර මහතාගේ ප්‍රයත්නය අගැයිය යුතු ය.